The Journal of Archaeology and Heritage Studies (JAHS) 10 (II) 2023: 87-97 pp

The Journal of
ARCHAEOLOGY & HERITAGE STUDIES

Journal Home page http://ssh.rjt.ac.lk/index.php/jahs/

Descriptive article

# The Polonnaruwa Ancient Technology Museum changed Sri Lanka's museum tradition: an observation

**Anuradha Abeysekara**

Education Promoting Officer, Ancient Technology Museum, New Town, polonnaruwa, Sri Lanka.
anuradhaabeysekara1@gmail.com

ARTICLE INFO

***Article history:***
Received 11 October 2023
Accepted 06 July 2024
Available online 08 August 2024

**ABSTRACT**

The Ancient Technology Museum in Polonnaruwa, Sri Lanka, is a pioneering institution under the Department of National Museums, dedicated to the study and preservation of ancient technology. Opened as the eleventh regional museum and housed in a purpose-built structure, it marks a significant development 142 years after the Colombo National Museum. The museum aims to identify and conserve Sri Lanka's ancient technological heritage, providing educational resources for researchers, students, and the general public. It features exhibits across 27 technological fields, including agriculture, metalwork, pottery, construction, and textiles, spread across eight galleries. The museum also promotes tourism, utilizing advanced technologies like Kiosks, TV panels, digital displays, 3D printing, and virtual reality to offer an interactive and educational experience. The inclusion of an activity gallery and innovation center further enhances visitor engagement and learning. As a result, the museum stands out as a modern and comprehensive facility, embodying international standards in Sri Lanka's museum landscape.

***Keywords:* Ancient Technology, Polonnaruwa, Museum, Sri Lanka, Heritage**

# ශ්‍රී ලංකාවේ කෞතුකාගාර සම්ප්‍රදාය වෙනස් කළ පොළොන්නරුව පුරාණ තාක්ෂණ කෞතුකාගාරය: විමසුමක්

## 1. හැඳින්වීම

වර්ෂ 1877 ක් වූ ජනවාරි මස පළමු වන දිනෙන් ආරම්භවන ශ්‍රී ලංකාවේ කෞතුකාගාර ඉතිහාසය තුළ නව පරිච්ඡේදයක් සනිටුහන් කිරීම 2019 වර්ෂයෙහි පොළොන්නරුව පුරාණ තාක්ෂණ කෞතුකාගාරය ඉදි කිරීමත් සමඟ සිදු විය. ඒ අනුව ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ එකොළොස්වැන්න ලෙස පොළොන්නරුව පුරාණ තාක්ෂණ කෞතුකාගාරය වර්ෂ 2019 ජූලි මස 03 වන දින මහජන ප්‍රදර්ශනය සඳහා විවෘත විය.

කෞතුකාගාරයක් යනු ඓතිහාසික, සංස්කෘතිකමය හෝ ස්වාභාවික විද්‍යාත්මක වශයෙන් වැදගත්කමක් සහිත පෞරාණික භාණ්ඩ අත් පත් කර ගන්නා වූත් ඒවා සංරක්ෂණය කර පවත්වාගෙන යන්නා වූත්



JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

ආයතනයකි. වර්ෂ 1946 දී පිහිටුවන ලද ජාත්‍යන්තර කෞතුකාගාර සංගමය විසින් "කෞතුකාගාරය" යන්න අර්ථ දක්වා ඇත්තේ "මිනිසා හා ඔහුගේ පරිසරය පිළිබඳ ද්‍රව්‍යමය සාක්ෂි අත්පත් කරගන්නා වූ, සංරක්ෂණය කරන්නා වූ, පර්යේෂණ පවත්වන්නා වූ හා ප්‍රදර්ශනය කරන්නා වූ ද, මහජනයාගේ අධ්‍යයනය, අධ්‍යාපනය හා සන්තුෂ්ටිය සඳහා විවෘතව පවතින, සමාජයේ සේවයට හා දියුණුවට පවත්වාගෙන යන ලාභ නොලබන ස්ථිර ආයතන" (සිල්වා 2016. 22) වශයෙනි. ඒ අනුව කෞතුකාගාරයක් යනු අධ්‍යාපනික හා පර්යේෂණ කාර්යයන් සඳහා පමණක් නොව, මිනිසුන්ගේ සන්තුෂ්ටිය හා විනෝදාශ්වාදය ආදී වින්දනීය තත්ත්වයන් උදෙසා ද පවත්වා ගෙන යනු ලබන ආයතනයක් බව මෙයින් පැහැදිලි වේ.

කෞතුකාගාරයක් යම් කිසි නිශ්චිත තේමාවක් මූලික කර ගනිමින් නිර්මාණය කරනු ලබයි (Chakrabarti, 2011. 23). ඒ අනුව පුරාණ තාක්ෂණ කෞතුකාගාරය ද මෙම සිද්ධාන්තය තුළ පිහිටා නිර්මාණය කර ඇති අතර එහි ප්‍රධාන තේමාව වනුයේ ශ්‍රී ලංකාවේ පැරණි තාක්ෂණය හා සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කිරීමයි. ඒ අනුව ශ්‍රී ලංකාවේ පැරණි තාක්ෂණික ක්‍රියාකාරකම් විසි හතක් හා බැඳි ප්‍රදර්ශන මැදිරි අටක් තුළ මීට අදාළ තොරතුරු ඉදිරිපත් කර තිබේ.

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව යනු ශ්‍රී ලංකාවේ කෞතුකාගාර සම්බන්ධයෙන් කටයුතු කෙරෙන ප්‍රධානතම රාජ්‍ය ආයතනය යි. මෙය වර්ෂ 1877 ජනවාරි මස 01 වැනි දින ආරම්භ කළ කොළඹ ජාතික කෞතුකාගාරය කේන්ද්‍රව බිහිවූ දෙපාර්ත-මේන්තුවකි (දිසානායක, 2006. 15, 16). මේ වන විට ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව සතුව කෞතුකාගාර එකොළහක් පවතී. පොළොන්නරුව පුරාණ තාක්ෂණ කෞතුකාගාරය ඉදි කිරීමත් සමග එතෙක් ශ්‍රී ලංකාවේ පැවති සාම්ප්‍රදායික කෞතුකාගාර රාමුවෙන් ඔබ්බට ගමන් කළ හැකි වූයේ යයි පෙන්වා දීම සාධාරණය. එය වසර 142 කට පසු දෙපාර්තමේන්තුව ලබා ගත් ජයග්‍රහණයක් වශයෙන් හැඳින්වීමට ද හැකි වේ. ඊට බලපාන ප්‍රධානතම හේතුව වනුයේ පැරණි තාක්ෂණය සම්බන්ධ තොරතුරු නව තාක්ෂණය හරහා ද ඉදිරිපත් කිරීමට මෙහි දී සැළසුම් කර තිබීමයි.

ශ්‍රී ලංකාවේ පෞද්ගලික සහ රාජ්‍ය මට්ටමෙන් පාලනය වන කෞතුකාගාර බොහෝමයක් ඇති අතර ඒවා සියල්ලක්මපාහේ නිර්මාණය කර ඇත්තේ ඓතිහාසික කලාත්මක හෝ පුරාවිද්‍යාත්මක වටිනාකම් ප්‍රදර්ශනය කිරීම සඳහා ය. ඒ අනුව ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් මෙම සාම්ප්‍රදායික සංකල්පයන් අභිබවා කාලීන අවශ්‍යතාවයක් තෝරා ගනිමින් මෙම කෞතුකාගාරය නිර්මාණය කර ඇත. ඒ අනුව ශ්‍රී ලංකාවේ පැරණි තාක්ෂණය සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම සඳහාම නිර්මාණය කරන ලද එකම දේශීය කෞතුකාගාරය ලෙස ද මෙම කෞතුකාගාරය පෙන්වා දිය හැකි වේ.

ශ්‍රී ලංකාවේ ප්‍රථම තාක්ෂණික කෞතුකාගාරය මෙය වුවද ලොව බොහෝ රටවල තාක්ෂණික තොරතුරු ප්‍රදර්ශනය කිරීම සඳහා කෞතුකාගාර බොහෝමයක් ඉදිකර ඇත. ඒ අතර ජර්මනියේ මියුනිච්හි පිහිටි ඩොයිෂ් (Deutsches Museum) කෞතුකාගාරය ලොව විශාලතම විද්‍යා හා තාක්ෂණ කෞතුකාගාරය ලෙස හඳුනාගත හැකි අතර එහි තාක්ෂණික අංශ පනහකට අධික ප්‍රමාණයක තොරතුරු ඉදිරිපත් කර ඇත (Deutsches Museum 2024). එසේම කැලිෆෝනියාවේ පිහිටි පරිගණක ඉතිහාසය (Computer History Museum) සම්බන්ද කෞතුකාගාරය හා Exploratorium කෞතුකාගාරය ද තාක්ෂණික කෞතුකාගාර අතර වඩාත් ප්‍රචලිත කෞතුකාගාර වේ (Computer History Museum 2024). එසේම ඇමරිකාවේ ස්මිත්සෝනියන් කෞතුකාගාරයට අනුබද්ධව ඉදි කර ඇති ජාතික ගුවන් හා අභ්‍යවකාශ තාක්ෂණ කෞතුකාගාරය (Exploratorium 2024), ලන්ඩන් නුවර පිහිටි විද්‍යා හා තාක්ෂණ කෞතුකාගාරය (Science Museum 2018), හා බ්‍රිතාන්‍යයේ විද්‍යා හා කාර්මික කෞතුකාගාරය (Science and Industry Museum 2018), දකුණු ඇමරිකාවේ විද්‍යා හා තාක්ෂණ කෞතුකාගාරය (Griffin Museum of Science and Industry 2024) ද ඉන් කිහිපයකි. ඒ අනුව මෙකී කෞතුකාගාර විසින් තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා භාවිත කර ඇති නවීන තාක්ෂණික උපක්‍රම සියල්ලක්ම පුරාණ තාක්ෂණ කෞතුකාගාරය තුළ භාවිත නොවුන ද යම් තරමකින් හෝ ජාත්‍යන්තර කෞතුකාගාර මට්ටමට ළඟා වීම සඳහා උත්සහයක් දරා ඇති බව පෙන්වා දිය හැකි වේ.




**සැලැසුම 01: පොළොන්නරුව තාක්ෂණික කෞතුකාගාරයේ බිම් මහල**




**සැලැසුම 02: පොළොන්නරුව තාක්ෂණික කෞතුකාගාරයේ පළමු වැනි මහල**




**සැලැසුම 03: පොළොන්නරුව තාක්ෂණික කෞතුකාගාරයේ දෙවැනි මහල**


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk



ඡායාරූපය 01: පොළොන්නරුවේ ඉතිහාසය මැදිරිය



ඡායාරූපය 02: ප්‍රාග් හා පූර්ව ඓතිහාසික තාක්ෂණය මැදිරිය



ඡායාරූපය 03: කෘෂි හා වාරි තාක්ෂණය මැදිරිය

මෙම කෞතුකාගාරයේ ප්‍රධාන තේමාව වනුයේ ශ්‍රී ලංකාවේ පැරණි තාක්ෂණය සම්බන්ධව තොරතුරු ඉදිරිපත් කිරීමයි. ඒ අනුව යම් කාර්යයක් කාර්යක්ෂමව ඉටු කර ගැනීම සඳහා යොදාගනු ලබන මෙවලම් හෝ උපක්‍රම තාක්ෂණය වශයෙන් හැඳින්විය හැකි වේ (Yilmaz 2023. 35). ආරම්භයේ සිටම මිනිස් මොළය වර්ධනය වීමට සාපේක්ෂව තාක්ෂණය ද සංවර්ධනය විය. ප්‍රාග් ඓතිහාසික යුගයේ දී මානවයාට සමාන ජීවීන් බිහි වීමේ සිට ඔවුන් ශාරීරික හා සංස්කෘතිකමය වශයෙන් අත්පත් කරගත් දියුණුව පසු කාලීන දියුණු තාක්ෂණයන් බිහි වීමට හේතු වූ බව නොරහසකි. එහෙත් මෙම සියල්ල ප්‍රායෝගික මානව අවශ්‍යතා මත සිදු වූවකි. ඒ අනුව ඉතා ඈත අතීතයේ සිටම ශ්‍රී ලාංකිකයන් විසින් තමන්ගේ කාර්යයන් කාර්යක්ෂමව ඉටුකර ගැනීම සඳහා උසස් අයුරින් තාක්ෂණික මෙවලම් සහ විධික්‍රම භාවිත කර තිබේ (Semenoy 1964, 01,02). වාරි කර්මාන්තය, කෘෂි කර්මාන්තය, යුධ උපක්‍රම හා යකඩ නිස්සාරණය ආදිය ඉන් කිහිපයකි.

මෙකී තාක්ෂණික අංශ අධ්‍යයනය කිරීමට, නැරඹීමට හා ඒ පිළිබඳ තොරතුරු විශ්ලේෂණය කිරීම සඳහා පොදු විධිමත් ආයතනයක් මෙතෙක් ශ්‍රී ලංකාවේ ස්ථාපිතකොට නොමැති අතර ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවට එම කාර්යය සඳහා දායකත්වය සැපයීමට හැකි විය. ඒ අනුව ශ්‍රී ලංකාවේ පුරාණ තාක්ෂණය හා සම්බන්ධ කෞතුක භාණ්ඩ හා ආදර්ශක එක් රැස් කිරීම, ලේඛනගත කිරීම හා සංරක්ෂණය කොට අනාගත පරපුරට උරුම කොට දීමේ අරමුණින් ද සමාජයේ සියලුම ජන කොටස් හා පුද්ගල, අධ්‍යයන, පර්යේෂණ කටයුතු මෙන්ම විනෝදාශ්වාදය ලබා ගැනීම සඳහා ද මෙම කෞතුකාගාරය සහ තොරතුරු මධ්‍යස්ථානය ස්ථාපිත කොට ඇත.

කෞතුකාගාරය නිර්මාණය කිරීමේ ප්‍රධාන අරමුණු හා කාර්යභාරයන් කිහිපයක් ඇත. එනම්,

- ශ්‍රී ලංකාවේ පුරාණ තාක්ෂණික අංග හඳුනා ගැනීම
- ශ්‍රී ලංකාවේ පුරාණ තාක්ෂණික උරුමය ආශ්‍රිත දැනුම සංරක්ෂණය කර මතු පරපුරට උරුම කරදීම
- වත්මන් හා අනාගත පරපුරෙහි අධ්‍යයන, අධ්‍යාපන හා පර්යේෂණ සඳහා අවස්ථාව ලබා දීම හා එමගින් ඔවුන් නව පර්යේෂණ වෙත යොමු කිරීම
- ශ්‍රී ලංකාවේ පුරාණ තාක්ෂණය සම්බන්ධ අධ්‍යාපන හා පර්යේෂණ මධ්‍යස්ථානයක් වශයෙන් කටයුතු කිරීම
- මේ පිළිබඳ අධ්‍යයන කටයුතුවල නිරත වූවන්ගේ මෙන්ම විශ්ව විද්‍යාල හා පාසල් ප්‍රජාවගේ ද, සාමාන්‍ය මහජනයාගේ ද දැනුම වර්ධනය කිරීම සඳහා අංග සම්පූර්ණ පුස්තකාලයක් පවත්වාගෙන යාම


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

- ඉතිහාසයේ අනාධිමත් කාලයක සිට මෙරට ජනයා විසින් උරුම කරදුන් විශිෂ්ඨ තාක්ෂණික දැනුම පිළිබඳ සංකල්ප ලෝකයට සම්ප්‍රේෂණය කිරීම
- දෙස් විදෙස් සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම

## 2. කෞතුකාගාර ගොඩනැගිල්ල

මහල් තුනකින් සමන්විත මෙම ගොඩනැගිල්ලෙහි බිම් මහලෙහි අංක 01 සිට 04 දක්වා මැදිරි පිහිටුවා ඇත. පළමු මහල තුළ අංක 05 සිට 07 දක්වා මැදිරි ද ක්‍රියාකාරකම් මැදිරිය, නව්‍යකරණ මැදිරිය, ශ්‍රවනාගාරය, පොත් අලෙවිසැල හා සමරු අලෙවිසැල ආදිය පිහිටා ඇත. දෙවන මහලෙහි එක් අර්ධයක් පුස්තකාලය සඳහා වෙන්කොට ඇති අතර අනෙක් අර්ධයේ අංග සම්පූර්ණ සම්මන්ත්‍රණ ශාලාවක් ස්ථාපිත කර ඇත.

## 3. කෞතුකාගාරයේ ප්‍රදර්ශන මැදිරි පෙළගැස්ම

මැදිරි අංක 01. - පොළොන්නරු ඉතිහාසය හා සබැඳි මැදිරිය
මැදිරි අංක 02. - ප්‍රාග් හා පූර්ව ඓතිහාසික තාක්ෂණය
මැදිරි අංක 03. - මැටි භාණ්ඩ හා ලෝහ තාක්ෂණය
මැදිරි අංක 04. - කෘෂි කාර්මික හා වාරි තාක්ෂණය
මැදිරි අංක 05. - ගොඩනැගිලි තාක්ෂණය
මැදිරි අංක 06. - සිතුවම්, මූර්ති හා දැව නිර්මාණ තාක්ෂණය
මැදිරි අංක 07. - නාවුක, රෙදිපිළි හා ගණිත මිණිත තාක්ෂණ
මැදිරි අංක 08. - ක්‍රියාකාරකම් මැදිරිය
මැදිරි අංක 09. - නව්‍යකරණ මැදිරිය
ඉටි ප්‍රතිමා කෞතුකාගාරය

### 3.1 පොළොන්නරුවේ ඉතිහාසය හා සම්බන්ධ මැදිරිය

ශ්‍රී ලංකාවේ ක්‍රි.ව. 1017 සිට 1236 දක්වා කාලය තුළ පාලන කටයුතු සිදු වූ පොළොන්නරුව රාජධානිය සම්බන්ධව තොරතුරු ප්‍රධාන වශයෙන් මෙම මැදිරිය තුළ අන්තර්ගත වේ. ඒ අනුව පොළොන්නරුව රාජධානි කාලයට අයත් සමාජීය, සංස්කෘතික, දේශපාලනික, කලාත්මක, ආගමික හා ආර්ථික අංශයන් නියෝජනය කෙරෙන කෞතුක භාණ්ඩ සැලකිය යුතු ප්‍රමාණයක් මෙම මැදිය තුළ ප්‍රදර්ශනය කර ඇත. ඒ අතර පොළොන්නරු යුගයෙහි පැවති බෞද්ධාගමික හා හින්දු ආගමික ප්‍රබෝධයන් සම්බන්ධව ප්‍රදර්ශනය කර ඇති කෞතුක භාණ්ඩ විශේෂත්වයක් ගනී. එයින් ශිව දේව ප්‍රතිමාව නිරූපණය කෙරෙන නටරාජ මූර්තිය හා පාර්වතී දේවිය ආදී ලෝකඩ ප්‍රතිමා සුවිශේෂී නිර්මාණ වේ. එසේම මෙම ප්‍රදර්ශන අල්මාරිය තුළ හින්දු ආගම හා සම්බන්ධ ශිව භක්තිකයන්ගේ මූර්ති මෙන්ම ශිව දේවාලවලින් සොයා ගන්නා ලද පූජා භාණ්ඩ රාශියක් ද ප්‍රදර්ශනය කර තිබේ.

එසේම මෙම මැදිරිය තුළ අනුරාධපුර යුගයට අයත් ලක්ෂණ සහිත පොළොන්නරු කාල සීමාවෙන් සොයාගත් බුද්ධ ප්‍රතිමා හා ධාතු කරඬු එකතුවක්, කොරල් ගලින් නිර්මාණය කරන ලද ක්‍රි.ව. 12 වන සියවසට අයත් ප්‍රතිමා ශීර්ෂ කිහිපයක්, පොළොන්නරු යුගයට අයත් මැටි බඳුන් හා කාසි එකතුවක් මෙන්ම පොළොන්නරු කාල සීමාවට අදාළ යුධ උපකරණ හා අවි ආයුධ එකතුවක් ද අන්තර්ගත වේ. මීට අමතරව ගල් විහාරයේ විද්‍යාධර ගුහාවෙහි නිර්මාණය කර ඇති ධ්‍යාන මුද්‍රාව සහිත සමාධි ප්‍රතිමාවෙහි ආකෘතියක් හා සඳකඩ පහණ ඇතුළු කලාත්මක නිර්මාණ ආකෘතීන් ආදිය ද ප්‍රදර්ශනය කර ඇත. පොළොන්නරුව යුගයෙහි සමස්ත ඉතිහාසය සම්බන්ධව අධ්‍යයනය කරන්නෙකුට මෙම කෞතුකාගාරයෙහි පළමු මැදිරිය අතිශය ප්‍රයෝජනවත් වනු ඇත.

කෞතුක භාණ්ඩවලට අමතරව මෙම මැදිරියෙහි ඇති තවත් එක් සුවිශේෂීයත්වයක් වනුයේ භාණ්ඩ සම්බන්ධව අන්තර්ගත සියලුම තොරතුරු ඩිජිටල් පුවරු මගින් හා වීඩියෝපට ලෙස පුළුල් රූපවාහිනී තිර මගින් ප්‍රදර්ශනය කර තිබීමත් ය. එසේම කෞතුකාගාරයේ ඇති සුවිශේෂී පහසුකමක් වන ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ කට්ටලය භාවිත කිරීම හරහා ද ඒ ඒ කෞතුක භාණ්ඩ සම්බන්ධයෙන් සවිස්තරාත්මක තොරතුරු රාශියක් ලබා ගත හැකිය. එය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන ප්‍රධාන භාෂා ත්‍රිත්වයෙන්ම ප්‍රදර්ශනය වන බැවින් විදේශීය සංචාරකයෙකුට වුවද පහසුවෙන් භාවිත කිරීමේ හැකියාව පවතී.

### 3.2 ප්‍රාග් හා පූර්ව ඓතිහාසික තාක්ෂණය සම්බන්ධ මැදිරිය

අදින් වසර 125,000 කට ඉහත ජීවත් වූ ප්‍රාග් මානවයින් සම්බන්ධව තොරතුරු හමුවන කාල පරිච්ඡේදය ප්‍රාග් ඓතිහාසික යුගය වශයෙන් හැඳින්වෙන බව පොදුවේ දන්නා කරුණකි. ලොව බිහි වූ සියලුම තාක්ෂණික අංගයන්හි මූලාරම්භයන් සිදු වූයේ මෙම ප්‍රාග් ඓතිහාසික යුගයේදී ය. ක්‍රමික මානව පරිණාමයත්

සමඟ හෝමෝ සාපියන්ගේ බිහි වීම සහ ඔවුන් ශාරීරික හා සංස්කෘතිකමය වශයෙන් අත්පත් කරගත් දියුණුව පසු කාලීනව ඇති වූ දියුණු ශිෂ්ටාචාර බිහි වීම සඳහා හේතු විය (දැරණියගල 1991, 24,25). එය මෙම මැදිරිය තුළ ඇතුළත් තොරතුරු අධ්‍යයනය කිරීමේදී වඩාත් පැහැදිලි වේ.

ඒ අනුව ප්‍රායෝගික භාවිතය නැමැති සිද්ධාන්තය තුළ පිහිටා සියලුම ප්‍රාග් ඓතිහාසික තාක්ෂණික අංග සකස් වී ඇති ආකාරය මෙම මැදිරියෙහි නිර්මාණය කර ඇති ප්‍රදර්ශන කුටි අධ්‍යයනය කරන්නාවූ ඕනෑම අයෙකුට පහසුවෙන් වටහා ගත හැකි වේ. ශිලා මෙවලම් තාක්ෂණය මෙම යුගයට අදාළ ප්‍රධාන තාක්ෂණික අංගය වන අතර පුරා ශිලා, මධ්‍ය ශිලා හා නව ශිලා වශයෙන් වන කාල පරිච්ඡේද තුනටම ආදාළ සාධක මෙහි ප්‍රදර්ශනය කර තිබේ. ඒ අනුව සීගිරිය පොතාන හා අලිගල ආශ්‍රිතව සිදු කළ කැණීම්වලින් හමු වූ ශිලා මෙවලම් මෙම මැදිරිය තුළ ප්‍රදර්ශනය කර තිබේ.

එසේම ක්‍රි.පූ. 6 වන සියවසට පෙර එහෙත් ප්‍රාග් ඓතිහාසික යුගයට පසු කාලය පූර්ව ඓතිහාසික අවධිය වශයෙන් හැඳින්වේ. මෙම යුගය සම්බන්ධයෙන් බොහෝ තොරතුරු අනාවරණය වනුයේ පූර්ව ඓතිහාසික සුසාන භූමි ආශ්‍රයෙනි. මෙම මැදිරිය තුළ පූර්ව ඓතිහාසික යුගයට අයත් යාන්ඔය සුසාන භූමියෙන් හමු වූ ශිලා මංජුසා සුසානයක්, පොම්පරිප්පුව මැටි බරණි සුසානයක් හා ඒ ආශ්‍රිතව හමු වන භාණ්ඩ එකතුවක් ප්‍රදර්ශනය කර තිබේ. මේවා ක්‍රි.පූ. 3 හා 1 වන සියවස් වලට අයත් වන අතර ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කැණීම් අංශය මගින් පරිත්‍යාග වශයෙන් ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවට ලැබී ඇත. මීට අමතරව මෙම මැදිරිය තුළ ද රූපවාහිනී තිරවල අන්තර්ගත වීඩියෝපට අධ්‍යයනය කිරීමේ පහසුකම ද සලසා දී තිබේ.

### 3.3 මැටි බඳුන් හා ලෝහ නිර්මාණ තාක්ෂණික මැදිරිය

මිනිසා විසින් සංස්කෘතිකමය වශයෙන් අත් කරගත් දියුණුවෙහි ප්‍රබල ප්‍රතිඵලයක් ලෙස පසු කාලීනව දියුණු ශිෂ්ටාචාරික අංගයක් බවට පත් වූ මැටි කර්මාන්තය හා ලෝහ කර්මාන්තය හඳුනාගත හැකි වේ. මැටි බඳුන් නිර්මාණය වෘත්තිමය වශයෙන් ''කුඹල් කර්මාන්තය'' යනුවෙන් හඳුන්වයි. එහි ඉතිහාසය ක්‍රි.පූ. 5300 දක්වා ඉහතට දිව යන අතර ප්‍රථම මැටි බඳුන් හා සම්බන්ධ ශ්‍රී ලාංකේය සාධකය හමු වනුයේ දොරවක කන්ද ප්‍රාග් ඓතිහාසික ගුහාවෙනි (Wijepala, 1992, 33, සෝමදේව, 2017). එසේම ශ්‍රී ලංකාව පුරාවට සිදු කරන ලද පුරාවිද්‍යාත්මක කටයුතු තුළින් මූල ඓතිහාසික යුගයට අයත් මැටි බඳුන් සාධක බොහෝමයක් ද ලැබී තිබේ (සෝමදේව, කන්නන්ගර, විද්‍යාලංකාර, 2016). මැටි බඳුන් නිර්මාණයේ දී යොදා ගන්නා ප්‍රධාන උපකරණය වනුයේ සකපෝරුව යි. මෙම මැදිරිය තුළ පැරණි සක පෝරුව ආශ්‍රයෙන් මැටි බඳුන් නිර්මාණය කිරීමේ ක්‍රමවේදය හා විවිධ වර්ගවල මැටි බඳුන් නිර්මාණය සම්බන්ධයෙන් තොරතුරු ඉදිරිපත් කර තිබේ. ඒ අතර සජීවී සකපෝරුව ආශ්‍රයෙන් මැටි බඳුනක් නිර්මාණය කරන කාන්තාවක් නව තාක්ෂණය හරහා ඉදිරිපත් කර තිබීම ද මෙහි දැකිය හැකි විශේෂ ලක්ෂණයකි. එය මෙම මැදිරියේ ප්‍රදර්ශන ඉදිරිපත් කිරීම්වල දියුණු තත්ත්වයක් නියෝජනය කරයි.

එසේම ලෝහ කර්මාන්තය යනු පැරණි කාලයේ සිටම මෙරට දියුණුව පැවති තවත් එක් ප්‍රධාන කර්මාන්තයකි. මෙම මැදිරිය තුළ යකඩ නිස්සාරණය කිරීමේ ක්‍රමවේද සම්බන්ධයෙන් තොරතුරු රාශියක් ඉදිරිපත් කර තිබේ. ඒ අනුව ශ්‍රී ලංකාවෙන් හමුවී ඇති යකඩ උදුන් දෙකක් වන සමනළවැව යකඩ උදුන හා අලකොළ වැව යකඩ උදුනෙහි ආකෘතීන් මෙහි ප්‍රදර්ශනය කර ඇත. මෙම උදුන් දෙක තුළ ක්‍රියාත්මක වී ඇති තාක්ෂණය ද්විත්වාකාර වන බව මෙම උදුන් අධ්‍යයනය කිරීමේ දී මනාව පැහැදිලි වේ. එසේම පුරාණ කම්මලක ක්‍රියාකාරීත්වය ද මෙහි දී දැකගත හැකි වේ.

යකඩ කර්මාන්තය හා සමගාමීව දියුණු වූ තවත් එක් තාක්ෂණික අංගයක් වනුයේ ලෝහ වාත්තු කිරීමේ ක්‍රම ශිල්පය යි. මෙහි දී ලෝහ වාත්තු කිරීමේ නිවැරදි පියවර සියල්ල ප්‍රදර්ශන කුටියක් මගින් ඉදිරිපත් කර තිබේ. එසේම මෙහි දී වාත්තු ක්‍රමවේදය සඳහා යොදා ගන්නා ද්‍රව්‍ය හා ආවුධ සම්බන්ධයෙන් ද පූර්ණ අවබෝධයක් ලැබිය හැකි වේ. එමෙන්ම ක්‍රි.ව. 12 වන සියවසේ දී නිර්මාණය වූ දැදිගම ඇත් පහන නම් විශිෂ්ට නිර්මාණයෙහි ආකෘතියක් හා එහි නිර්මාණ තාක්ෂණය පිළිබඳ තොරතුරු අධ්‍යයනය කිරීමේ හැකියාව ද මෙම මැදිරියේ දී උදා වේ.

### 3.4 කෘෂි කර්මාන්තය හා වාරි තාක්ෂණය පිළිබඳ මැදිරිය

වියළි කලාපයට සුවිශේෂී වූ වාරි කර්මාන්තය වනාහි ශ්‍රී ලංකාවේ තාක්ෂණය ලොවට විදහා දක්වන ප්‍රධානතම අංගයකි (විතානාච්චි 2005, 99). මහ වැවු, බිසෝ වැවු, බැඳි වැවු, කැටකුළු හා කරවිට වැවු මෙන්ම එල්ලංගා වැවු පද්ධතිය ද ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තය තුළ ප්‍රකට ය. මෙම මැදිරිය තුළ මෙකී වාරි නිර්මාණයන්ට අදාළ බොහොමයක් තොරතුරු අධ්‍යයනය කළ හැකි අතර සිතියම් හා ආකෘති මගින් පහසුවෙන් ග්‍රහණය කරගත හැකි පරිදි ඒවා ප්‍රදර්ශනය කර තිබේ. ඒ අනුව මෙම මැදිරිය තුළ වාරි කර්මාන්තයට අදාළ බොහෝ සාධක ප්‍රදර්ශනය කර ඇති අතර ඒවා පහසුවෙන් හා සවිස්තරාත්මකව අධ්‍යයනය කිරීම සඳහා දුර්ලභ හා අනන්‍යතාවකින් යුතු තොරතුරු වීඩියෝපට මාලාවක් ඔස්සේ ඉදිරිපත් කර තිබීම ද සුවිශේෂී වේ.

එසේම මහවැලි ගඟෙහි අතු ගංගාවක් වන අඹන් ගඟ හරස් කර ඉදි කර ඇති අංගමැඩිල්ල අමුණ හා ගල් වැද්දුම් තාක්ෂණය මගින් එහි නිර්මාණකරණය සිදු කර ඇති ආකාරය මෙම මැදිරිය තුළ දී මනාව අධ්‍යයනය කළ හැකි වේ. එසේම භූ විෂමතාවය හා ඉහළ තාක්ෂණික උපක්‍රම භාවිතයට ගනිමින් නිර්මාණය කර ඇති එල්ලංගා හෙවත් වියළි කාලාපීය පද්ධති වැව් ක්‍රමය පිළිබඳව ද මෙම මැදිරිය තුළ තොරතුරු අන්තර්ගත වේ. මෙහි දී සිතියම් හා ආකෘති මඟින් අධ්‍යයනයේ පහසුව සලසා දී ඇති අතර අවශ්‍ය තොරතුරු බොහෝමයක් විද්‍යුත් පුවරු මගින් ප්‍රදර්ශනය කර තිබේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තය හා සම්බන්ධ තාක්ෂණය අධ්‍යයනය කිරීම සඳහා මෙම කෞතුකාගාරය තුළ පූර්ණ අවකාශ සලසා දී ඇත.

එසේම වාරි කර්මාන්තයට සමගාමීව ශ්‍රී ලංකාව තුළ දැකිය හැකි තවත් එක් සුවිශේෂී කර්මාන්තයක් වනුයේ කෘෂි කර්මාන්තයයි. දේශීය ගොවියා ප්‍රධාන වශයෙන් ගොඩ ගොවිතැන හා මඩ ගොවිතැන ද, තවත් විටෙක හේන් ගොවිතැන ද යන ක්‍රම අනුගමනය කරමින් ගොවිතැන් කටයුතු සිදු කරන ලද අතර ඒ සඳහා සාම්ප්‍රදායිකව යොදා ගන්නා ලද උපකරණ රාශියකි. එවැනි උපකරණ ප්‍රදර්ශනය කිරීම සඳහා විශේෂ අවධානයක් මෙම කෞතුකාගාරයේ ප්‍රදර්ශන සැළසුම්වල දී යොමු කර තිබේ. පොළොන්නරුව ආලාහන පිරිවෙන් භූමිය ආශ්‍රිතව සිදු කරන ලද කැණීම්වලින් හඳුනා ගන්නා ලද කෘෂි උපකරණ බොහෝමයක් මෙම මැදිරිය තුළ ප්‍රදර්ශනය කර ඇත. එසේම කෘෂිකර්මාන්තයේ දී යොදා ගන්නා මේ වන විට සමාජයෙන් ඈත් වී ගොස් ඇති සාම්ප්‍රදායික උපකරණ හා කිරුම් මිනුම් උපකරණ රාශියක් ද මෙම මැදිරිය තුළ ප්‍රදර්ශනය කර තිබේ.



ඡායාරූපය 04: පුරාණ වාස්තු විද්‍යා තාක්ෂණය මැදිරිය



ඡායාරූපය 05: පුරාණ වාස්තු විද්‍යා තාක්ෂණය මැදිරිය



ඡායාරූපය 06: නව්‍යකරණ මැදිරිය


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

## 03.5 පුරාණ වාස්තු විද්‍යා තාක්ෂණය ඉදිරිපත් කරන මැදිරිය

වාස්තු විද්‍යාව හා ගොඩනැගිලි තාක්ෂණය යනු ඉපැරණි තාක්ෂණික අංගයකි. ශ්‍රී ලංකාවේ මුල් රාජධානි යුගවල සිට ගෘහ නිර්මාණ කිරීම සම්බන්ධයෙන් ඉතා දක්ෂ තාක්ෂණික උපක්‍රම අනුගමනය කර ඇති බව මුලාශ්‍රයගත තොරතුරුවලින් මෙන්ම පුරාවිද්‍යා සාධක මගින් ද සනාථ වේ. අනුරාධපුරය හා පොළොන්නරුව වැනි පැරණි නගර ආශ්‍රිත දැක ගත හැකි නටබුන් එයට ශාක්ෂි දරන්නා සේම මහාවංසය වැනි වංස කතා ද ඊට සාක්ෂි සපයයි. මෙම මැදිරිය තුළ අනුරාධපුර යුගයෙහි මෙන්ම පොළොන්නරු යුගයෙහි දැකිය හැකි ගෘහ නිර්මාණ රාශියක් පිළිබඳ ආකෘති මගින් බොහෝ තොරතුරු ප්‍රදර්ශනය කර ඇත. ඒ අතර සීගිරිය උද්‍යාන නිර්මාණ තාක්ෂණය හා මාළිගා නිර්මාණය සම්බන්ධව ද තොරතුරු ඉදිරිපත් කර තිබේ.

මෙහි දී විශේෂයෙන්ම ගල් වැද්දුම් තාක්ෂණය උපයෝගී කර ගනිමින් ගොඩනැගිලි හා අනෙකුත් නිර්මාණ ඉදි කිරීමත්, පොළොන්නරු යුගයට ආවේණික ගෘහ නිර්මාණ ලක්ෂණ සහිත හින්දු වාස්තු විද්‍යාත්මක නිර්මාණ ඉදි කිරීමේ තාක්ෂණයත් වෙන් වෙන් වශයෙන් පැහැදිලි වන පරිදි මෙම මැදිරිය පිළියෙල කර තිබේ. එසේම ස්පර්ශක පුවරුවක් ආධාරයෙන් සිදු කළ හැකි ක්‍රියාකාරකමක් තුළින් දාගැබක නිර්මාණ තාක්ෂණය හා ස්තූප සම්බන්ධ සියලුම තොරතුරු එක් ස්ථානයක් තුළ දී නැරඹිය හැකි වීම ද මෙහි ඇති තවත් වැදගත්කමකි. ශ්‍රී ලංකාවේ පැරණි ආරුක්කු නිර්මාණ තාක්ෂණය, සනීපාරක්ෂක උපක්‍රම, සංඝාරාම නිර්මාණ තාක්ෂණය හා වැසිකිළි කැසිකිළි ගොඩනැගිලි ඉදි කර ගැනීම ආදිය සම්බන්ධව පූර්ණ තොරතුරු මෙම මැදිරිය තුළ අන්තර්ගත වේ.

## 3.6 සිතුවම්, මූර්ති හා දැව නිර්මාණ තාක්ෂණය පිළිබිඹු කෙරෙන මැදිරිය

මෙම මැදිරිය තුළ ශ්‍රී ලංකාවේ දැකිය හැකි පැරණි සිතුවම් කලාව සම්බන්ධව තොරතුරු රාශියක් ප්‍රදර්ශනය කර තිබේ. එහි අනුරාධපුර, පොළොන්නරු හා මහනුවර වශයෙන් ශ්‍රී ලාංකේය සිතුවම් කලාව ප්‍රධාන යුග තුනක් යටතේ බෙදා දක්වයි. මෙම එක් එක් යුගයට ආවේණික සිතුවම් ලක්ෂණවල විවිධත්වයක් ඇති අතර ඒවා මෙම මැදිරිය තුළ දී පහසුවෙන් අධ්‍යයනය කළ හැකි වේ. එමන්ම සිතුවම් සඳහා වර්ණ සකස් කර ගැනීම, පසු තලය හා බදාම සකස් කර ගැනීම ආදියේ දී භාවිත කළ තාක්ෂණික උපක්‍රම පිළිබඳව පහසුවෙන් ග්‍රහණය කර ගත හැකි වන පරිදි වීඩියෝපට ආශ්‍රයෙන් තොරතුරු ඉදිරිපත් කර තිබේ. එසේම වර්ණක සඳහා යොදා ගත් පාෂාණ වර්ග හා අමුද්‍රව්‍ය එකතුවක් ද මෙහි ප්‍රදර්ශනය කර ඇත.

සිතුවම් කලාව සම්බන්ධව දැකිය හැකි තවත් එක් සුවිශේෂී අංගයක් වන සාරිපුත්ත පුස්කොළ පොතෙහි අනු පිටපතක් ද මෙම මැදිරිය තුළ ප්‍රදර්ශනය වේ. එහි සිතුවම් හා ප්‍රතිමා නිර්මාණකරණයට අදාළ සියලු තොරතුරු අන්තර්ගත කර ඇත. ඒ අනුව ප්‍රතිමා නිර්මාණයේ දී භාවිත කෙරෙන ප්‍රමාණ මූලධර්ම හා මිනුම් ක්‍රම ආදිය සම්බන්දයෙන් පැහැදිලි තොරතුරු රාශියක් මෙහිදී අධ්‍යයනය කළ හැකි ය. මෙහිදී බුද්ධ ප්‍රතිමා නිර්මාණයේ දී පැරණි ශිල්පීන් විසින් යොදා ගත් "ලඹ තටුව" භාවිතයෙන් මිනුම් ගැනීම සම්බන්ධව පූර්ණ අවබෝධයක් ලබා ගත හැකි අතර ගෘහ නිර්මාණ ශිල්පයේ දී භාවිත කළ දැව නිර්මාණ තාක්ෂණය සම්බන්ධයෙන් ද තොරතුරු රාශියක් අධ්‍යයනය කළ හැකි වේ.

## 3.7 නාවුක, රෙදිපිළි හා ගණිත මිණිත තාක්ෂණ මැදිරිය

මෙම මැදිරිය තුළ පුරාණ රෙදි නිෂ්පාදනය සම්බන්ධයෙන් මෙන්ම ජල යාත්‍රා සම්බන්ධයෙන් ද තොරතුරු රාශියක් අන්තර්ගත කර ඇත. ඒ අනුව ශ්‍රී ලංකාවේ මේ වන විට දැකිය හැකි පැරණිතම රෙදි විවීමේ යන්ත්‍ර ක්‍රමයක් වන "අල්ගේ යන්ත්‍රය" මෙහි ප්‍රදර්ශනය කර ඇති අතර වීඩියෝපට මගින් එහි ක්‍රියාකාරීත්වය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර තිබේ. එසේම කපු කැටීමේ දී අවශ්‍ය වන යන්ත්‍ර උපකරණ සම්බන්ධයෙන් ද මෙහි දී අවබෝධයක් ලැබිය හැකි ය. ශ්‍රී ලංකාවේ තවත් එක් පැරණි කර්මාන්තයක් වන ධීවර කර්මාන්තය පිළිබඳ තොරතුරු බොහෝ පැරණි පොත්පත් වල ද සඳහන් වේ. මෙය කරදිය ධීවර කර්මාන්තය හා මිරිදිය ධීවර කර්මාන්තය ලෙස ආකාර දෙකකින් පැවති අතර ඒ සඳහා විවිධ වර්ගයන්හි ජල යාත්‍රා භාවිත කර තිබේ. මෙම මැදිරිය තුළ මසුන්


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

ඇල්ලීමේ දී යොදා ගත් විවිධ ජල යාත්‍රාවල ආකෘති සහිත සන්දර්ශන කුටියක් සහ ශ්‍රී ලංකාවේ මේ වන විට දැකගත නොහැකි දුර්ලභ ජල යාත්‍රාවල ආකෘතීන් කිහිපයක් දැක ගැනීමේ හැකියාව පවතී. එසේම ආකර්ශනීය ස්පර්ශක පුවරුවක් මගින් ඉපැරණි ගණිත මිනිත ක්‍රමවේද හා හෙළ භාෂාවේ විකාශනය සම්බන්ධව තොරතුරු රාශියක් ඉදිරිපත් කර තිබේ.





ඡායාරූපය 07-08: පොළොන්නරු තාක්‍ෂණ කෞතුකාගාරයේ පුස්තකාලයේ ඇතුළත දර්ශන




ඡායාරූපය 09: පොළොන්නරු තාක්‍ෂණ කෞතුකාගාරයේ ඉටි ප්‍රතිමා මැදිරිය

### 3.8 ක්‍රියාකාරකම් මැදිරිය

කෞතුකාගාරයක ස්ථාපිත විය යුතු සුවිශේෂීම අංගයක් වශයෙන් ක්‍රියාකාරකම් මැදිරිය හඳුනාගත හැකි වේ. ශ්‍රී ලංකාවේ වෙනත් කෞතුකාගාරවල දුර්ලභ එහෙත් පුරාණ තාක්ෂණ කෞතුකාගාරයට සුවිශේෂ වූ ප්‍රායෝගික ක්‍රියාකාරකම් මැදිරියක් මෙහි ස්ථාපිත කර ඇත. ඒ අනුව පළමු මැදිරියෙහි සිට හත්වන මැදිරිය දක්වා කෞතුකාගාර ප්‍රදර්ශනයේ පවතින විවිධ තාක්ෂණික අංශයන්ට අදාළ ප්‍රායෝගික ක්‍රියාකාරකම් බොහෝමයක් මෙම මැදිරිය තුළ අන්තර්ගත වේ. එනම් ප්‍රාග් ඓතිහාසික ශිලා මෙවලම් තාක්ෂණය, දැව නිර්මාණ තාක්ෂණය, සාම්ප්‍රදායික රෙදි කර්මාන්තය ආශ්‍රිත තාක්ෂණය, පැරණි සකපෝරුව ආශ්‍රයෙන් මැටි භාණ්ඩ නිර්මාණය කිරීම හා හේන් ගොවිතැන් කටයුතුවල දී සතුන් පලවා හැරීම සඳහා භාවිත කළ සාම්ප්‍රදායික ක්‍රමවේද ආදී තවත් ක්‍රියාකාරකම් රැසක් මෙහි අන්තර්ගත වේ. ඒ අනුව මෙම මැදිරිය හරහා බාල, මහලු, වැඩිහිටි කුමන අයෙකුට වුවද එම සාම්ප්‍රදායික අත්දැකීම් ප්‍රායෝගිකව විඳ ගැනීමේ අවස්ථාව උදා වේ.

### 3.9 නව්‍යකරණ මැදිරිය

පුරාණ තාක්ෂණ කෞතුකාගාරය යනු පැරණි තාක්ෂණය නව තාක්ෂණය හරහා ලොවට සම්ප්‍රේෂණය කිරීමට දැරූ උත්සහයක් වූ බැවින් නව තාක්ෂණික උපක්‍රම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර තිබේ. නව්‍යකරණ මැදිරිය ස්ථාපිත කෙරෙනුයේ නව තාක්ෂණික අංශ කිහිපයක් පිළිබඳ දැනුම සම්ප්‍රේෂණය කිරීමේ අරමුණින් ය. ඒ අනුව මෙම මැදිරිය තුළ දී ත්‍රිමාණ මුද්‍රණ තාක්ෂණය (3D printing), ලයිඩා තාක්ෂණය (Lidar Technology), ත්‍රිමාන වීඩියෝ දර්ශන තාක්ෂණය (Virtual Reality), ත්‍රිමාන රූප නිර්මාණ තාක්ෂණය (Augment Reality) ආදී තාක්ෂණික අංග භාවිතයට අවකාශ සලසා දී තිබේ. මේ තුළින් පැරණි තාක්ෂණය ස්පර්ශ කිරීමේ අවකාශය සලසා දී ඇති අතර එය නරඹන්නන් සඳහා නවමු අත්දැකීමක් ද වී තිබේ.

මෙහි දී ත්‍රිමාණ මුද්‍රණ තාක්ෂණය මගින් පුරාණ සකපෝරුවක නිර්මාණය කළ මැටි බඳුනක් නව තාක්ෂණික උපකරණ හරහා කෙටි කාලයක් තුළ දී මුද්‍රණය කර ගැනීමට අවස්ථාව සලසා දී ඇත. එසේම


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

Vertual Reality තාක්ෂණය මගින් පුරාණ සීගිරිය රජ මාළිගයෙහි හා උද්‍යානයෙහි ස්වභාවය පිළිබඳව එම ස්ථානයේ සිටින්නාක් හා සමානව ඇවිද යමින් අවට පරිසරය අත්විඳිය හැකිය. එසේම පුරාණ වාරි තාක්ෂණික අංග වන බිසෝ කොටුව, රළපනාව, වැවු බැම්ම හා වාන් දොරටු ආදිය නූතනයේ ඉදි වූ විශාල ජලාශයක් වන මොරගහකන්ද ජලාශයේ ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ 3D Vertual Reality (VR) තාක්ෂණය ඔස්සේ නැරඹීමේ හැකියාව පවතී. එසේම Reality (AR) තාක්ෂණය යොදා ගනිමින් ආදි මානව වාසස්ථානයක් ප්‍රතිරූපණය කර ඇති අතර ඒ තුළින් ගල් ලෙන් ආශ්‍රිතව සිදුවූ ප්‍රාග් ඓතිහාසික මානව ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රායෝගිකව අවබෝධයක් ලබා ගැනීමේ හැකියාව පවතී.

### 3.10 පුස්තකාලය හා තොරතුරු සම්පත් මධ්‍යස්ථානය

කෞතුකාගාරයෙක් තුළ පුස්තකාලයක් පවත්වාගෙන යාම අතීතයේ සිට පැවති සම්ප්‍රදායයක් ලෙස ද පෙන්වා දිය හැකි වේ. ඒ අනුව කොළඹ ජාතික කෞතුකාගාරයේ ද ඉතා හොඳ පොත් එකතුවක් සහිත පුස්තකාලයක් තිබේ. ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන පුස්තකාලයක් හා තොරතුරු සම්පත් මධ්‍යස්ථානයක් මෙම කෞතුකාගාරය තුළ ද ස්ථාපිත කර ඇති අතර එය විමර්ශන පුස්තකාලයක් වශයෙන් ක්‍රියාත්මක වේ. ඒ අනුව පාසැල් විෂය නිර්දේශවලට අදාළ කරුණු සහිත මෙන්ම විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් සඳහා අවශ්‍ය පොත් පත් සහිතව මෙම පුස්තකාලය නිර්මාණය කර ඇත. මෙහි ඇති තවත් එක් සුවිශේෂීයත්වයක් වනුයේ විද්‍යුත් සංවේදක පුවරුවක් (kioks) මගින් පැරණි ශිලා ලිපි කියවීමේ හැකියාව ලබා දී තිබීමයි. ඒ අනුව මේ වන විට සියයකට අධික ශිලා ලිපි ප්‍රමාණයක් මේ හරහා කියවීමේ අවස්ථාව නරඹන්නන් වෙත සලසා දී තිබේ. එසේම දෛනික පුවත්පත් කියවීම සඳහා ද විද්‍යුත් සංවේදක පුවරුවක් (kioks) ස්ථාපිත කොට තිබේ. පොත් කියවීම හා සඟරා පරිශීලනයට අමතරව මෙහි ඇති තවත් එක් විශේෂත්වයක් වනුයේ අන්තර්ජාලය භාවිත කරමින් ස්වයං අධ්‍යයන සිදු කළ හැකි කලාපයක් පිහිටුවා තිබීමයි. ඒ අනුව මාසික හෝ වාර්ෂික සාමාජිකත්වය ලබා ගැනීම යටතේ ඉහත සඳහන් කළ සියලු පහසුකම් අත්විඳීමේ හැකියාව පවතී.

### 3.11 ඉටි ප්‍රතිමා කෞතුකාගාරය - WAX MUSEUM

නිදහසින් පසු ශ්‍රී ලංකාවේ පාලනය ගෙන ගිය රාජ්‍ය නායකයින් කිහිප දෙනෙකුගේ ඉටි ප්‍රතිමා මෙම කොටසෙහි නිර්මාණය කර ඇති අතර ඩී.එස්. සේනානායක මැතිතුමන්, ඩඩ්ලි සේනානායක මැතිතුමන්, එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා, රණසිංහ ප්‍රේමදාස මැතිතුමා හා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා යන ප්‍රභූවරුන්ගේ ප්‍රතිමා ඒ අතර වේ.

මේ අනුව පුරාණ තාක්ෂණ කෞතුකාගාරය යනු ශ්‍රී ලංකාවේ කෞතුකාගාර ඉතිහාසය පූර්ණ වශයෙන්ම වෙනස් කළ සන්ධිස්ථානයක් ලෙස ඉතිහාසයට එක් වනු නොඅනුමාන ය.

## 4. සමාලෝචනය

ශ්‍රී ලංකාවේ ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවට අයත් එකොළොස්වන ප්‍රාදේශීය කෞතුකාගාරය වශයෙන් පොළොන්නරුව ප්‍රදේශයේ විවෘත වූ පුරාණ තාක්ෂණ කෞතුකාගාරය පැරණි තාක්ෂණය හා සම්බන්ධව අධ්‍යයනය කිරීම සඳහා මෙරට ඉදි කර ඇති එකම කෞතුකාගාරය වේ. මෙහි ඇති සුවිශේෂීයත්වය වන්නේ වර්ෂ 1877 දී ආරම්භ කළ කොළඹ ජාතික කෞතුකාගාරයෙන් අනතුරුව වසර 142 කට පසු කෞතුකාගාරයක් වෙනුවෙන් ම නිර්මාණය වූ ගොඩනැගිල්ලක මෙය ස්ථාපිත කර තිබීමයි. ඒ අනුව ශ්‍රී ලංකාවේ පුරාණ තාක්ෂණික අංග හඳුනා ගැනීම, තාක්ෂණික උරුමය ආශ්‍රිත දැනුම සංරක්ෂණය කර මතු පරපුරට උරුම කර දීම, අධ්‍යයන හා පර්යේෂණ කටයුතු සඳහා දායකත්වය සැපයීම සඳහා අංග සම්පූර්ණ පුස්තකාලයක් පවත්වාගෙන යාම ආදිය මෙම කෞතුකාගාරයේ මුඛ්‍ය අරමුණු බවට පත් වී ඇත. මෙම අරමුණු සඵල කිරීම සඳහා ප්‍රධාන වශයෙන් මැදිරි අටක් තුළ තාක්ෂණික ක්ෂේත්‍ර විසි හතක් සම්බන්ධව කෞතුක භාණ්ඩ හා ආදර්ශක ඇසුරින් තොරතුරු ප්‍රදර්ශනය කර තිබේ. මෙම සියලු තොරතුරු නවීන තාක්ෂණික උපකරණ හරහා ඉදිරිපත් කර තිබීමෙන් අධ්‍යයනයේ පහසුව සැලසීම තවත් එක් සුවිශේෂීයත්වයකි. එසේම ශ්‍රී ලංකාවේ දැකගත හැකි


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

එකම ඉටි ප්‍රතිමා කෞතුකාගාරය ද මෙහි ස්ථාපිත කර තිබීම තවත් එක් විශේෂත්වයකි. පැරණි තාක්ෂණයන් අභිබවා නවීන තාක්ෂණය නැගී සිටීමට දරණ උත්සහය තුළ හමු වන නවීන තාක්ෂණික ක්‍රමවේද පිළිබඳ ප්‍රාමාණික දැනුමක් ලබා ගැනීම සඳහා නව්‍යකරණ මැදිරියක් ස්ථාපිත කර ඇති අතර එහිදී ත්‍රිමාන මුද්‍රනකරණය, ත්‍රිමාන රූපී සංරචනයන් හා තවත් තොරතුරු බොහෝමයක් දැක ගැනීමේ අවස්ථාව ද සලසා දී තිබේ. ඒ අනුව අන්තර්ජාතික කෞතුකාගාරයක දැකගත හැකි මූලික ලක්ෂණ සහිතව මෙම කෞතුකාගාරය නිර්මාය වී ඇති අතර එය ශ්‍රී ලංකාවේ කෞතුකාගාර ක්ෂේත්‍රය තුළ දැකිය හැකි නව ප්‍රවණතාවක් සේ හඳුනාගත හැකි වේ.

## 5. උපකාරානුස්මෘතිය

මෙම ලිපිය පිළියෙල කිරීමේ දී තොරතුරු සාධනය කර ගැනීමට අවස්ථාව උදා වූයේ අප වෙත අදාළ කෞතුකාගාරයෙහි වෘත්තිකයෙකු ලෙස සේවය කිරීමට අවස්ථාව ලද බැවිනි. එනයින් ජාතික කෞතුකාගාර දෙපාර්තමෙන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය හා සහකාර අධ්‍යක්ෂතුමිය (උද්භිද විද්‍යා) වෙත ද අපගේ ස්තුතිය හිමි වේ.

## ආශ්‍රිත මූලාශ්‍රය


– දැරණියගල, ශිරාන්. (1991) *ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඉතිහාසය,* පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය

– දිසානායක, පී.ආර්. (2006) *ශ්‍රී ලංකාවේ කෞතුකාගාර ඉතිහාසය.* කර්තෘ ප්‍රකාශන

– විතානාච්චි, සී.ආර්. (2005) 'ශ්‍රී ලංකාවේ අතීත වාරි උරුමය හා වාරි පුරාවිද්‍යාව', *පුරාතන ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය,* පි. 95-100, මධ්‍යම සංස්කෘතික අරමුදල. සංස්කෘතික හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය

– සිල්වා, පී.එච්.ඩී.එච්. (2016) *කෞතුකාගාර විද්‍යා මූලධර්ම.* ඇස් ගොඩගේ සහ සහෝදරයෝ පුද්ගලික සමාගම: කොළඹ 10

– සෝමදේව, ආර්., කන්නන්ගර, පී., විද්‍යාලංකාර, ඒ. (2016) *ඉපැරණි ලෝක ශිෂ්ටාචාර,* අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

– සෝමදේව, ආර්. (2017) *ශ්‍රී ලංකාවේ ආදි ඉතිහාසය,* නියමුවෝ ප්‍රකාශනඃ මහරගම.

– Chakrabarti, Mahua (2011) *Education in Museum – A Handbook*, LAP LAMBERT Academic Publishing: Dudweiler Landstr, Germany

– Semenoy, S.A. (1964) *Prehistoric technology*, Cory, Adams and Mackay; London; http://asi.nic.in/asi_books/41420.pdf

– Wijepala, W., (1992). *Excavation.* In administration report of the Director General of Archaeology for the year 1997. PP.32-36.

– Yilmaz, Ozkan. (2023) *The Role of Technology in Modern Science Education*, https://www.researchgate.net/publication/376923855

– Deutsches Museum (2024) *The collection of the Deutsches Museum.* Available at: https://www.deutsches-useum.de/museum/sammlung (Accessed 2024 May 15)

– Computer History Museum (2024) *CHM DECODES TECHNOLOGY FOR EVERYONE* . Available at:https://computerhistory.org/this-is-chm/ (Accessed2024 May 15)

– Exploratorium (2024) *About us, Mission, Vision and Values*. Available at: https://www.exploratorium.edu/about-us (Accessed 2024 May 15)

– Science Museum (2018) *Objects and Stories*. Available at: https://www.sciencemuseum.org.uk/objects-and-stories (Accessed 2024 May 15)

– Science and Industry Museum (2018) *Objects and Stories* . Available at: https://www.scienceandindustrymuseum.org.uk/objects-and-stories (Accessed 2024 May 15)



JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk